# සවභාවික කෘමිනාශක දියරයක් සාදා ගනිමු.

අක්කර 1 ක වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| 1. සුදුළූණු | - 1 kg | 2. ඉඟුරු | - 500g |
| 3. අමු මිරිස් | - 200g | 4. දුම්කොළ | - 200g |
| 5. ගම්මිරිස් | - 200g | 6. කොහොඹ තෙල් | - 200ml |
| 7. රෙදි සෝදන සබන් | - 30g | 8. භූමි තෙල් | - 100ml |

සාදා ගන්නා අන්දම -

1. සුදුළූණු භූමිතෙල්වල දමා රැයක් පුරා පෙගෙන්නට හරින්න. ඉන් පසු ඒවා අමු මිරිස්, ගම්මිරිස් සහ ඉඟුරු සමඟ එකට එක්කර කොටා ගන්න.
2. දුම්කොළ දින එකක් ජලයේ පොඟවා හොඳින් පොඩි කර පෙරා ගන්න. එයට කොහොඹ තෙල් 200ml මිශ්‍ර කරන්න.

- 1 සහ 2 යන මිශ්‍රණ දෙකම හොඳින් කවලම් කර එක් භාජනයකට දමා, කෑලිවලට කපා ගත් සබන් එයට එක් කරන්න.
- ඉන් පසු සබන් කෑලි හොඳින් දියකරන්න.
- මෙම මිශ්‍රණයට ජලය ලීටර් 10ක් එකතු කර, අක්කරයක වී හෝ වෙනත් ඕනෑම වගාවකට යොදන්න.

රසායනික කෘමිනාශක ඉසීමෙන්,

- පසට හානි සිදු වේ.
- පසේ තත්වය බාල වේ.
- කෘමිනාශක බෝගවලට උරාගැනීම නිසා ඒවා ආහාරයට ගන්නා අපටද විවිධ ලෙඩ රෝග වැළඳේ.
- වගාවට හිතකර කෘමීන් විනාශ වේ.

ඉහත සඳහන් අහිතකර ප්‍රතිඵල වලින් මිදී, ආර්ථික ලාභ ලබා ගැනීමට හැකි බැවින්,

## ඔබත් අදම මෙය අත්හදා බලන්න.

UN-REDD PROGRAMME

WDF

කාන්තා සංවර්ධන පදනම

The GEF Small Grants Programme The Bahamas